**නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය**

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)**

# පුරප්පාඩු

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධිත) පනත මගින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කරන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, සැලසුම් ක්‍රියාත්මක කිරීම, ප්‍රමිතිකරණය සහ සහතික කිරීම් යනාදී කාර්යයන් ඉටුකිරීමේ ජාතික නියාමන ආයතනය වේ. මෙම කොමිෂන් සභාවේ පහත සඳහන් තනතුරු සඳහා මතු දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්‍ෂ (පුරප්පාඩු 02)

## 1. අධ්‍යක්‍ෂ (පාලන)

## 2. අධ්‍යක්ෂ (කර්මාන්ත සම්බන්ධතා)

**බාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම් හා පළපුරුද්ද**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම

සමග

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම / තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, කළමනාකරණ මට්ටමේ, තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**සුදුසුකම් හා පළපුරුද්ද**

අ. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අදාල වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

ආ. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කළමණාකාර සේවා ශ්‍රේණියේ (MM1-1) පළමු ශ්‍රේණියේ තනතුරක අදාල ක්ෂේත්‍රයේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය (මාසික) :** කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව HM 1-1 කාණ්ඩයේ මූලික වැටුප් පරිමාණය
රු. 80,295 - (2,270 x 15) - රු. 114,345/-

**වයස් සීමාව** : අවුරුදු 35 ට නොඅඩු හා අවු 55 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**වෙනත් කරුණු**

සෑම අපේක්ෂකයෙක්ම,

ආ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

ඇ. තනතුරට පැවරෙන කාර්යයන් මනාව ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය

ඈ. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

**බඳවාගැනීමේ ක්‍රමය :**

ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවීමෙන් පසුව පත්වීම් බලධරයා පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලබයි.

**පොදු කරුණු :**

අ. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගේ වැටුපෙන් 8% ගෙවිය යුතු අතර, මෙම කොමිෂන් සභාව විසින් ඔබගේ වැටුපෙන් 12% සමාන මුදලක් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට 3% ට සමාන මුදලක් ගෙවනු ලැබේ.

ආ. ඉහත මූලික වැටුපට අමතරව රජයේ අනුමත වෙනත් දීමනා හිමිවේ.

ඇ. මෙම තනතුර ස්ථිර වන අතර, පරිවාස කාලයකට යටත් වේ.

ඈ. බඳවාගැනීමේ පරිපාටි සංශෝධනයේදී ඇති විය හැකි සංශෝධනයන්ට යටත් විය යුතුය

ඉ. අයදුම්පත් යොමු කිරීමේදී ඉදිරිපත් කරනු ලබන සහතිකවල සහතික කරන ලද ජායා පිටපත් අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය **2020.08.25** වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය. දැනටමත් සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වන අතර සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන්නේද යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අපැහැදිලි අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්‍ෂ ජනරාල්**

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**

**"නිපුණතා පියස" 03 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,**

**කොළඹ 05.**

**වෙබ් අඩවිය : http://www.tvec.gov.lk**

Source: Dinamina, Daily News (2020.08.11)